# ශ්‍රී ලංකාව "නිර්මාණශීලී" කරවීම

අනෝකා පී. අබේරත්න

*''රටක් වශයෙන් සහ ජාතියක් වශයෙන් ඉදිරියට යාමට නම් අපි අපගේ දේශීය නිෂ්පාදන කෙරෙහි ඉහල ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුය''2016 පෙබරවාරි 5 වන දින පැවැත්වූ 'නව නිර්මාණ කරුවන් සඳහා ජනාධිපති සම්මාන' ප්‍රධානය කිරීමේ උත්සවයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා එසේ පැවසීය. නව නිර්මාණ කරුවන් බලගන්වමින් ඔවුන්ගේ නිර්මාණ දේශීය වෙළඳපොළට ගෙනඒමේ හැකියාව පුළුල් කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තමා බලාපොරොත්තු වන බවද ජනාධිපතිතුමා පැවසීය. අප රට තුල නව්‍යකරණයට සහාය දැක්වීමේ නව උනන්දුවක් දේශීය පාලනය විසින් දක්වන බව මෙම සිද්ධියෙන් නිරූපනය වන අතර එය ශ්‍රී ලංකාවේ ''නව්‍යකරණ සංස්කෘතියක් ''බිහිකිරීම සඳහා තැබූ ඉදිරි පියවරක් වනු ඇතැයි බලාපොරොත්තු තැබිය හැකිය. කඩඉම් නැති කතාබහේ (Unlocked blogger) යෙදෙන අනෝකා අබේවර්ධන මෙම ලිපිය මගින් ''නව්‍යකරණය'' සම්බන්ධයෙන් ගෝලීය සහ දේශීය පිලිගැනීම පිළිබඳව ඇයගේ අදහස් ඉදිරිපත් කරයි.*

ජපානය, ස්වීඩනය, ෆින්ලන්තය, දකුණු කොරියාව සහ ඊශ්‍රායලය යන රටවල තිබෙන, එහෙත් ශ්‍රී ලංකාව තුල නොමැති සාධකය කුමක්ද?

බ්ලූම්බර්ග් නව්‍යකරණ දර්ශකය අනුව මෙම රටවල් පහ නව්‍යකරණ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා ලොව ඉහලින්ම සිටින රටවල් බවට පත්ව ඇත. ඔවුන්, තම නිර්මාණශීලීත්වය යොදා ගනිමින් සමහර විශිෂ්ඨ තාක්‍ෂණික ආශ්චර්යයන් නිර්මාණය කර තිබේ.

දකුණු කොරියාව, ෆින්ලන්තය සහ ඊශ්‍රායලය සිය ශ්‍රම බලකාය හා සම්බන්ධයෙන් පශ්චාත් ද්වීතියික අධ්‍යාපනය ලබා දීම අතින් හොඳම රටවල් පහ අතර ඉදිරියෙන් සිටීමද සිත්ගන්නා කරුණකි.

මෙම සාධකයන් සිත්ගන්නා කරුණු වීමට හේතුව වන්නේ නව්‍යකරණය සහ නිර්මාණශීලීත්වය අප රටේ සහ ජනතාවගේ ධනාත්මක සංවර්ධනය සඳහාද බලපානා බැවිනි. එනමුත්, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පාසැල් තුල නිර්මාණශීලීත්වය ඉතා අඩුවෙන් දිරිගැන්වීමට ලක්වන කරුණක් වී ඇත. මෙම නිර්මාණශීලී අදහස් මගින් සරල එහෙත් ඉතා ඵලදයී විසඳුම් උපදවන නිසා බොහෝ සංවර්ධනය වන රටවල් නව්‍යකරණය සහ ව්‍යවසායකත්වය සමාජ අභියෝගයන්ට විසඳුමක් ලෙස හඳුනාගෙන ඇත.

සමාජ ව්‍යවසායකත්වය එවැනි එක් විසඳුමකි. මෙම යෙදුම අපට හුරු පුරුදු එහෙත්, ශ්‍රී ලංකාව තුල එය විධිමත් කිරීමට අවශ්‍ය අර්ථ දැක්වීමක් හෝ ප්‍රතිපත්ති රාමුවක් හෝ නොමැති යෙදුමකි. මෙම සරල එහෙත් ඉතා ශක්තිමත් සංකල්පය තරුණ දරුවන් නිර්මාණශීලී ක්‍රම මගින් අධ්‍යාපනය ලැබීමට යොමුකර ඇත. මේ සඳහා ප්‍රධාන උදහරණයක් වන්නේ 'එඩියුකේට් ලංකා' පදනමය (EducateLanka foundation). තවත් එවැනිම නිදසුනක් වන්නේ ප්‍රජාවන්ට වඩා යහපත් වෙළඳ පද්ධතියකට පිවිසීමේ අවස්ථාව සලසන අතරම පාරිභෝගිකයින්ට සෞඛ්‍යසම්පන්න වෙළඳපොළක් ලබාදෙන ගුඩ් මාකට් (Good Market) ජාලයයි. 2014 ජාතික මානව සංවර්ධන වාර්තාව අනුව යහපත් කාර්ය ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ ව්‍යවසායයන් සඳහා ණය සහ ව්‍යාපාර සංවර්ධන සේවාවන් ක්‍රියාත්මක වීම ජාතික මානව සම්පත් සහ රැකියා ප්‍රතිපත්තිය මගින් යෝජනා කර ඇත.

පශ්චාත් උපාධි අධ්‍යයනයන් සඳහා පර්යේෂණ කිරීමේදී අධ්‍යාපනඥයින් පිරිසකට සමාජ ව්‍යවසායකත්වය විස්තර කිරීමට උත්සාහ කිරීමේදී සහ සරසවි සිසුන්ට එය පහදා දීමට වෙර දැරීමේදී බොහෝ දෙනෙකුට මෙම සංකල්පය වටහාගැනීම කෙතරම් අපහසුදැයි මම පුද්ගලිකවම දැන ගතිමි. එයට හේතුව වන්නේ 'සමාජ වයවසායකතවය' ශ්‍රී ලාංකිකයින් විසින් එදිනෙදා නිතර සිතන සංකල්පයක් නොවීමය. මාතෘකාව ගැන කථා කිරීමෙන් නොව, සමාජ ව්‍යවසායකත්වය ක්‍රියාත්මක වන ආකාරයත් එයින් ඇතිකරන බලපෑමත් ප්‍රායෝගිකව ජනතාවට පෙන්වන තුරු ඒ පිළිබඳ වැටහීමක් ලබාගත නොහැක. ව්‍යවසායකත්වය පිළිබඳව පුළුල් ප්‍රවර්ධනයත් සහ අධ්‍යාපනයට ව්‍යවසායකත්ව මූලධර්ම හඳුන්වාදීමත්, අඩුවියදම් මුල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශයත් ව්‍යාපාරික ක්‍රියාකාරීන් අතර අන්තර් සම්බන්ධයත් ස්වයං රැකියා සංකල්පය ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය වන්නේ කෙසේදැයි 2014 ජාතික මානව සංවර්ධන වාර්තාව පෙන්වා දෙයි.

ලෝක ආර්ථික සංසදයේ ගෝලීය හැඩරුව සකසන්නන්ගේ කොටස් කරුවකු ලෙස සහ එකී ප්‍රජාවගේ නව වීරයෙකු ලෙස, අපගේ නව්‍යකරණයේ මට්ටම, ක්‍රියාත්මක වීම සහ නිර්මාණකරණය පිළිබඳව කෙනෙකු ඉමහත් සතුටට පත්වන අතරම, අප රටේ සමහර බුද්ධිමතුන් නිර්මාණශීලී වීම අමතක කර, තිබෙන සැටියෙන් පිළිගැනීමේ සම්ප්‍රදායික ගමන් මඟෙහිම යාම පිළිබඳව දුකටද පත් වනු ඇත.

සන්ද්‍රා වඳුරංගල නමැති සුවිශේෂී කාන්තාව සමග සිදුකළ සම්මුඛ සාකච්ඡාවක් මම මෑතකදී කියවීමි. ඇය දේශපාලනික වශයෙන් දිරිගන්වනු ලැබ සිටියත් ව්‍යවසායකත්වය සහ පරාර්ථකාමිත්වය තුලින් යහපත් සහ උසස් වෙනස්කම් සිදුකළ හැකි බව ඇය අවබෝධ කරගෙන සිටින බව මට පෙනී ගියේය. අප රටේ යෞවනයින් එවැනි උසස් පුද්ගලයින් සහ විශේෂයෙන්ම ක්‍රියාකාරීන් අනුගමනය කිරීම අත්‍යාවශ්‍යය.

අවසානයේදී ශ්‍රී ලංකාවේ සංවර්ධනය තිරසාරව සහ නව්‍යතාවයෙන් ඉරිදියට යාමට ඉවහල් වන්නේ දේශපාලනික වශයෙන් දිරිගන්වනු ලැබූ පුද්ගලයින්ගේ හෝ කණ්ඩායම්වල රසවත් කථා හෝ රටපුරා සිදුකරන ඔන්-ලයින් හෝ විවෘත ප්‍රචාරක ව්‍යාපාරයන් නොවේ. මක්නිසාද යත්, ක්‍රියාත්මක නොවී කිසිවක් වෙනස් නොවන නිසාය. වෙනත් කෙනෙකු වෙනස්කම් සිදුකරන තෙක් බලා සිටීමට වඩා ඔබ්බට ගිය ජීවිතයක් තිබෙන බව දැනගත් පසු, සමාජ ආර්ථික වශයෙන් සහ අධ්‍යාපනය තුලින් ඔවුනොවුන් බලගන්වා ගැනීමෙන් ජනතාව ක්‍රියාත්මක විය යුතුය. නිර්මාණශීලී බවින්. නව්‍යතාවයෙන් සිතීමෙන් සහ ක්‍රියාත්මක වීමෙන් මෙම වෙනස්කම් තමන්ටම සිදුකළ හැකි බව එවිට ඔවුන් අවබෝධ කරගනු ඇත. ධනාත්මක සංවර්ධනය සැබෑලෙස ආරම්භ වන්නේ එසේය.

*(UNLOCKED යනු ලොව ධනාත්මක වෙනසක් ඇතිකිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලාංකික යෞවනයන්ට සංවර්ධනය පිළිබඳ සිය අදහස් උදහස් සහ මතයන් ප්‍රකාශ කිරීම සඳහා ඇති අවකාශයකි. මෙහි ප්‍රකාශ කර ඇති අදහස් හුදෙක් ඒවායේ කතුවරුන් සතුය. ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) හෝ දිනපතා ෆිනෑන්ෂල් ටයිම්ස් පුවත්පත මෙම ප්‍රකාශවලින් දක්වා ඇති අදහස් නියෝජනය කරන්නේ හෝ අනුමත කරන්නේ නැත. UNLOCKED ප්‍රයත්නය ගැන වැඩි තොරතුරු දැනගැනීමට www.lk.undp.org වෙබ් අඩවියට පිවිසෙන්න.*